# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## පළමුවන ශ්‍රේණිය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

# විෂය නිර්දේශය

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් (සිංහල) - පළමුවන ශ්‍රේණිය

## 1. හැඳින්වීම

`පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්` නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බැලපෑම් කළා වූ හෝ කරන්නා වූ හෝ භෞතික, සමාජයීය සහ ජෛව පද්ධතීන් පිළිබඳ ව හා ඒවා පදනම් කර ගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටාපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර ක්‍රම ක්‍රමයෙන් එම වටාපිටාව සමඟ සාර්ථක ව අන්තර් ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලියේ දී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කනය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි. එසේ ම ඒ ඔස්සේ සිය වාග්මාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටාපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම, රැස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවිත ක්‍රියාවලියේ ම අංගයකි. මෙය නිරායාසයෙන් ම ඕනෑම ජීවියකු තුළ සිදු වන්නකි. දරුවාගේ එම නැඹුරුව වර්ධනය කිරීම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩ නැගීමේ පදනම විය.

එදිනෙදා ජීවිතයේ දී හමු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකු තුළ සාක්ෂරතාව, ගණිත දැනුම සහ ආගම පිළිබඳ නිපුණතාවලට අමතර ව තවත් ක්ෂේත්‍ර කිහිපයකට අයත් නිපුණතා වර්ධනය විය යුතු ය. මීට පෙර ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවන් හි සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණ ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා ආරම්භක විද්‍යාව වැනි විෂයයන් යටතේ එම නිපුණතා සාක්ෂාත් කර ගැනීමේ අවස්ථාව සලසා තිබුණි. එහෙත් නව විෂයමාලාවේ $පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්` නම් වූ පුළුල් විෂයයක් යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූලව මතු කර ගැනීමට ඉඩ සලසා ඇත.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය පළමුවන ප්‍රධාන අවධියේ දී තේමා 16 ක් මත විෂය නිර්දේශය ගොඩ නගා ඇත. සෞන්දර්ය, නිර්මාණ හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාළ නිපුණතා මතු කර ගැනීම මෙන් ම ආගම, මව්බස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද `පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්` යොදා ගත හැකිය. පළමුවන ශ්‍රේණියේ දරුවන්ගේ කතා බහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් මෙම ක්‍රියාකාරකම් මගින් මතු කර ගත හැකි ය. මෙම විෂයයට අදාළ ක්‍රියාකාරකම් කිරීමේ දී ගුරුවරයාට තවත් සහායකයන් සිටීම ඒවා සංවිධානයට පහසුවනු ඇත. එම පාසලේ ම 6 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ සහාය මේ සඳහා ලබා ගත හැකි වනු ඇත.

විෂය නිර්දේශයේ ඇතුළත් සියලු කොටස් ඒ ආකාරයෙන් ම ශ්‍රී ලංකාවේ සෑම පාසලක ම කළ යුතු යැයි අදහස් නො කෙරේ. මෙම අවධියේ දී දරුවන්ගේ පරිසරය සීමිත ය. එම සීමා ව තුළ ඇති දේ, සිදු වන දේ සියල්ල සෑම පාසලකට ම පොදු නොවේ. එහෙයින් දරුවන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පාරිසරික සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

මේ අනුව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කර ඇති එක් එක් තේමාවෙන් අපේක්ෂිත නිපුණතා කරා ළඟා වීමට, යෝජිත ක්‍රියාකාරකම් වෙනුවට වෙනත් ක්‍රියාකාරකම් ඔබට නිර්මාණය කර ගත හැකි අතර එසේ කිරීමේ දී අපේක්ෂිත නිපුණතා ඉටු වන අයුරින් ක්‍රියාකාරකම් සොයා ගැනීමට වග බලා ගත යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 2. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමුවන ශ්‍රේණිය සිට පස්වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය පරිශීලනය කිරීමෙන් සිසුන් තුළ පහත දැක්වෙන නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

- සිය වටාපිටාවේ චමත්කාරය හඳුනා ගෙන ඒ තුළින් වින්දනයක් ලබයි.
- ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා උචිත අයුරින් ඒවා සිය දින චර්යාව මුසු කර ක්‍රියා කරයි.
- සෞන්දර්යාත්මක දේ අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යයන්හි දී භාවිත කරයි.
- නිරෝගිමත් දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ලබයි.
- මිනිස් නිර්මාණ අගය කරයි.
- සිය වටාපිටාවේ සිටින ජීවීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- මිනිස් සමාජය, මිනිස් හැසිරීම් හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- පෘථිවිය, එහි සම්පත් හා අවකාශය මිනිසා කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කරයි.
- පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කර ගෙන සහ ඒ අනුව කටයුතු කරයි.
- සිය වටාපිටාවේ ශක්තිය සහ බලය යෙදීම ප්‍රජාවේ ඉදිරි ගමනට බලපාන අයුරු විමර්ශනාත්මක ව අගය කරයි.
- තම පරිහරණයේ ඇති ද්‍රව්‍ය හා උපකරණ හැසිරවීම මගින් අනාගත වැඩ ලෝකයට අවශ්‍ය හුරුව ලබයි.

## 3. පළමුවන ප්‍රධාන අවධියේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළ ඉගෙනුම් නිපුණතා

- පාසල් පරිසරයට අනුගතව කටයුතු කරයි.
- නිවසේ දී සතුටින් හා ඵලදායි ලෙස පුද්ගලයන් අතර අන්තර් සම්බන්ධතාවල නියැලෙයි.
- තොරතුරු රැස් කිරීම සඳහා නිරීක්ෂණ කරයි.
- අත්දැකීම් තුළින් සරල ක්‍රියාකාරකම්වල නියැලෙයි.
- සිරිත් විරිත්වලට අනුකූලව ක්‍රියාකරයි.
- පාසල හා සම්බන්ධ අතීත තොරතුරු විමසා බලයි.
- සෞඛ්‍යවත් දිවිපෙවතක් සඳහා යහපත් පුරුදු අනුගමනය කරයි.
- සුහද කතා බහ ඔස්සේ නිවැරදි ව තොරතුරු හුවමාරු කර ගනියි.
- අවට පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.
- තමා හා තම අවට පරිසරය පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගැනීමට දායක වෙයි.
- අන් අයට ප්‍රියජනක අන්දමින් තම ගති පැවතුම් පවත්වා ගනියි.
- මූලික ඉරියව් නිවැරදි ව පවත්වා ගනියි.
- එදිනෙදා කටයුතුවල දී සිය ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- අවකාශය උචිත ලෙස භාවිත කරමින් ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- අරමුණු ගත කාර්යයන් සඳහා සාමූහික ව වගකීමෙන් වැඩ කරයි.
- පරිසර විවිධත්වය කෙරෙහි සංවේදී ව ක්‍රියා කරයි.
- අවශ්‍ය අවස්ථාවල දී අන් අයට උදව් කිරීමට ඉදිරිපත් වෙයි.
- රූප සංකේත හා ලිඛිත පුවරු මගින් දැක්වෙන තොරතුරු ලබා ගනියි.
- තම අත්දැකීම් චිත්‍ර හා ඇඹීම් මගින් ප්‍රකාශ කරයි.
- පරිසරයේ ශබ්ද, නාද, චලන සහ චරිත නිරූපණය කරයි.
- අභිනය දක්වමින් රංගනයේ හා ගායනයේ නිරත වෙයි.
- විවිධ කටයුතුවල දී සමායෝජනයෙන් යුතු ව චලන දක්වයි.
- විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් විවිධ දේ නිර්මාණය කරයි.
- ලබාගත් අත්දැකීම් හා රැස් කරන ලද තොරතුරු තනිව හෝ සාමූහික ව හෝ පිරිසකට ඉදිරිපත් කරයි.
- නිවසේ දී හා පාසලේ දී සිය යුතුකම් හා වගකීම් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොමුවක්

- මෙම නිර්දේශයේ දී දරුවාගේ වටපිටාව තේමා 16 ක් ඔස්සේ විකාශය කර ඇත.
- සියලු දැ තෘප්තිදායක අත්දැකීම් වශයෙන් ලබා ගැනීමට දරුවනට ඉඩ සැපයිය යුතු වා මෙන් ම ඒ සඳහා ප්‍රමාණවත් සැලැස්මක් හා සූදානමක් අවශ්‍ය වනු ඇත.
- මෙහි ඇති අදහස්වලට අනුකූල ව ඉගෙනුම් හා හඳුන්වා දීමේ ක්‍රම යොදා පාඩම් සැලසුම් කර ගත යුතු ය.
- තොරතුරු වාර්තා කිරීම, තොරතුරු සොයා ගැනීම තරම්ම වැදගත් ය. මුල් අවධියේ දී වාචික ව හා කටු සටහන් මගින් සිය අත්දැකීම් ප්‍රකාශ කිරීමට දරුවන් පොළඹවන්න. ක්‍රමයෙන් වචන ද වාක්‍ය ද තරමක් සවිස්තරාත්මක රූප සටහන් ද යොදා ගැනීමට දරුවන් යොමු කරන්න.
- වැඩ සියල්ල හා උත්සාහය අගය කළ යුතු ය.
- සිසුන් කණ්ඩායම් වශයෙන් වැඩෙහි යොදවන්න. එහෙත් මුල් අවස්ථාවල දි කණ්ඩායමක කෙනකු වැඩ කළ යුතු ආකාරය පිළිබඳ ව දරුවනට මඟ පෙන්වීම් හා නිවැරදි කිරීම් අවශ්‍ය වනු ඇත.
- යම් තේමාවකට සම්බන්ධ ව ඉගෙනුම් ඉගැන්වීම් කර ගෙන යන අවස්ථාවේ දී ක්‍රම ක්‍රමයෙන් එක් රැස් වන තොරතුරු හා ද්‍රව්‍ය ක්‍රමයෙන් ගොඩ නැගෙන ප්‍රදර්ශනයක් බවට පෙරළන්න.
- තේමා ඉදිරිපත් කර ඇත්තේ නිශ්චිත පිළිවෙළකට නොවේ. ඕනෑ ම වේලාවකට උචිත තේමාවන් ඕනෑම තැනකින් තෝරා ගැනීමට නිදහසක් ඇත. කාලයට උචිත අයුරින් තේමා තෝරා ගැනීමෙන් සම්පත් පරිහරණය වඩා පහසුවනු ඇත.

## 5. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගැන්වීමට වඩා, ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තිය ම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගත යුතු ය. එක ම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යැමට හැකි ය. ඒ මගින් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනීමට හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, අත්හදා බැලීම්, කෙටි ව්‍යාපෘති, රැස් කිරීම්, භූමිකා රංගන, වැනි විවිධ ඉගෙනුම් ක්‍රමෝපාය ද පුද්ගලයන්ගෙන්, පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍යවලින් ද විද්‍යුත් මාධ්‍යවලින් ද තොරතුරු රැස් කිරීම් අඩංගු විය හැකි ය.

## 6. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පළමුවන ශ්‍රේණිය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යටතේ පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය විය යුත්තේ දවස පුරා මේසය අසල පුටුවක වාඩි වී සිටීම වෙනුවට විවිධ ඉරියව්වෙන් හා සතුටින් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් දැකිය හැකි වන පරිදි ය.

- පාසල් කාලය තුළ දී පළමුවන ශ්‍රේණිය සිසුන් ප්‍රධාන වශයෙන් සෙල්ලම් ස්වරූපයක් ගත් ක්‍රියාකාරකම්වල නිරත වීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම.
- එළිමහනේ ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීම.
- පාසලේ ක්‍රීඩා සෞන්දර්යාත්මක කටයුතු විශේෂ දින සැමරුම් අවස්ථා හා වෙනත් විෂයය සමගාමී කටයුතුවල දී පළමුවන ශ්‍රේණිය දරුවන් ද සහභාගි කර ගැනීම.
- පාසලේ ඉහළ පන්තිවල (6/5 වන ශ්‍රේණි) සිසුන්ගේ උදවු ද අවශ්‍ය අවස්ථාවල දී ලබා දීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

සිසුන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී ඔවුන් ඉගෙනීම සම්බන්ධයෙන් දක්වන හැකියාවන් හා නොහැකියාවන් පිළිබඳ සුවිශේෂ වැටහීමක් ගුරුවරුනට තිබිය යුතු ය. මේ සඳහා පන්ති කාමරය තුළ නිරන්තරයෙන් කරනු ලබන තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් අදහස් කෙරේ. සිසුන් තක්සේරු කිරීමේ පරමාර්ථ රාශියක් තිබේ. නමුත් ප්‍රාථමික ශ්‍රේණිවල කරනු ලබන තක්සේරු කිරීම් ප්‍රධාන අරමුණු දෙකක් මුල් කරගෙන ක්‍රියාත්මක වේ. ඉන් පළමුවන්න වන්නේ අනාවරණයයි. තමාගේ පන්ති කාමරයේ සිටින සෑම සිසුවකුට ම ගැළපෙන ආකාරයේ අධ්‍යාපනයක් ලබා දීමට නම් ගුරුවරුන් හට ඒ සෑම සිසුවකු පිළිබඳ ව ම වැටහීමක් තිබිය යුතු ය. දෙවැනි අරමුණ සිසුන් පිළිබඳ අනාවරණය කරගත් තොරතුරු පදනම් කරගෙන එක් එක් සිසුන් සඳහා උපදේශාත්මක පසු පෙවුමක් ලබා දීම ය. එම නිසා ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක තක්සේරු කිරීම් සිසුන් සඳහා ශ්‍රේණි ලබා දීම, සිසුන් එකිනෙකා සසඳමින් අගය කිරීම, සිසුන් ඔවුන්ගේ හැකියාවන් අනුව වර්ග කිරීම වැනි කරුණුවලින් ඔබ්බට ගිය දෙයක් වශයෙන් සැලකිය හැකි ය. ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වන තක්සේරු කිරීම නිර්ණායක මූලික, ගුරුවරයා මුල් කරගත් අවිධිමත්, සම්භවන තක්සේරු කිරීමක් ලෙස ද හඳුන්වා දිය හැකි ය. විෂයමාලාවේ අපේක්ෂිත නිපුණතා අනුව ගොඩනඟා ගත් ඇගයීම් නිර්ණායක ඇතුළත් කර ඇත. පන්ති භාර ගුරු මහත්ම මහත්මීන් මේ නිර්ණායක කරා සිසුන් කෙතෙක් දුරට ළඟා වී තිබේ දැයි, තක්සේරු කිරීම යටතේ අනාවරණය කරගත යුතු ව ඇත.

කණ්ඩායම් වැඩවල නිරතවීමේ දී ප්‍රශ්න ඇසීම, අවිධිමත් ලෙස සිසුන් නිරීක්ෂණය කිරීම, ඔවුන් සමඟ සාකච්ඡා කිරීම කාර්ය සාධන ගොනු පවත්වා ගෙන යාම, ගෙදර වැඩ ඇගයීම වැනි අවිධිමත් ක්‍රම ද බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඒවා අවශ්‍ය පරිදි භාවිත කිරීම, විශේෂයෙන් ප්‍රාථමික ශ්‍රේණිවල දී පන්ති භාර ගුරුවරයාගේ වගකීමයි. තක්සේරු කිරීම වාර අවසානයේ, ඒකකයක් අවසානයේ නොව ඉගැන්වීම් කටයුතු කරන අතරතුර ම ක්‍රියාත්මක විය යුතු දෙයකි. තක්සේරු කිරීම වඩාත් හොඳ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීම පිණිස එක් එක් ශිෂ්‍යයා පිළිබඳ ව ගැඹුරින් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් වටහාගෙන කටයුතු කිරීම යෝග්‍යය.

## 8. ගෙදර වැඩ පැවරීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය යටතේ පන්ති කාමරය හා ආසන්න පරිසරය තුළ විවිධ ක්‍රියාකාරකම් කිරීමට සිසුනට අවස්ථාව සළසා ඇත. මේ සඳහා විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය වේ. ක්‍රියාකාරකම් කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයෙන් පමණක් ද්‍රව්‍ය රැස් කිරීම කළ යුතු වේ. එක් එක් තේමාවක් යටතේ කරනු ලබන වැඩ සඳහන් කරමින් පරිසර ලිපක් සකස් කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම තුළින් සිසුන් කල්තබා දැනුවත් කිරීමටත් මෙම කාර්ය වඩාත් පහසු වේ.

තවද, ක්‍රියාකාරකම් සඳහා පාසල් ගෙවත්ත හා පන්ති කාමර පරිසර තුළ හැකිතාක් සිසු ක්‍රියාකාරකම්වල යෙදවීම හා එම වැඩ නිමාව තෙක් ඉටු කිරීම සිදු කළ යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී පමණක් ගෙදර වැඩ පැවරීම කළ හැකි ය. ගෙදර වැඩ පැවරීමේ දී ශිෂ්‍යයාගේ මට්ටමට ගැළපෙන හා ශිෂ්‍යයාට තනිව කළ හැකි වැඩක් මෙන් ම කළ හැකි ප්‍රමාණයේ වැඩක් පැවරීම වඩාත් උචිතය. සමහර අවස්ථාවල දී ගමේ/නගරයේ තොරතුරු, සුවිශේෂ පුද්ගලයන් පිළිබඳ තොරතුරු, ඓතිහාසික තොරතුරු නිවස ආශ්‍රිත විවිධ තොරතුරු රැස් කිරීමට සිදු වන අවස්ථා ඇත. මෙවන් තොරතුරු විමසා බැලීමක දී වැඩිහිටි සහාය ලබා ගැනීමට සිදු විය හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තේමාව :- 1.0 අපයි පාසලයි

**නිපුණතා :-**

පාසල තුළ තමාට සමීප ව කටයුතු කරන පුද්ගලයන්ගේ භූමිකා හඳුනාගෙන ක්‍රියා කරයි.
පාසලේ ක්‍රියාත්මක වන විධානවලට අවනත ව කටයුතු කරයි.
පාසල් සංස්කෘතියට අනුගත ව ක්‍රියා කරයි.
පාසල් පරිසර සැකැස්ම හඳුනා ගැනීම සඳහා ගවේෂණය කරයි.
පාසලේ දී අන් පුද්ගලයන් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
පාසල තමාට සුරක්ෂිත ස්ථානයක් යන හැඟීමෙන් ක්‍රියා කරයි.
පාසලේ අලංකාරය, පිරිසිදුකම හා ක්‍රමවත් බව පවත්වාගෙන යාමට දායක වෙයි.
සෙල්ලම් මිදුල භාවිත කරමින් නිදහස් චලන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

පාසලේ නම, පන්ති භාර ගුරුවරයා හා විදුහල්පති පිළිබඳ තොරතුරු
පාසලේ විවිධ ස්ථාන පිළිබඳ තොරතුරු
පාසලේ සිටින සිය වැඩිමහල් සොහොයුරු සොහොයුරියන් සහ හොඳින් හඳුනන සිසුන් සිටින ස්ථාන
පාසලේ භාවිත කරන පොදු විධාන සහ චාරිත්‍ර වාරිත්‍ර
පන්තිය ඇතුළත හා පිටත පිරිසිදු ව ක්‍රමවත් ව අලංකාර ව තබා ගැනීමට කළ යුතු කාර්යයන්
ළමා නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සහ සෙල්ලම් මිදුල භාවිත කරමින් නිදහස් චලන ක්‍රියාකාරකම්

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

සෞන්දර්යාත්මක අංග ඇතුළත් කෙටි උත්සවයක් සංවිධානය කිරීම. මේ සඳහා 6/5 ශ්‍රේණිවල සිසුන්ගේ සහාය ලබා ගැනීම හා ඔවුන්ගේ හැකියාවන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දීම. පන්ති භාර ගුරුතුමිය, විදුහල්පති, විදුහල්පති කාර්යාලය පිහිටි ස්ථානය හඳුනා ගැනීම.
පාසල් භූමියේ චාරිකාවක නිරත වීම හා විවිධ ස්ථාන හඳුනා ගැනීමට සැලැස්වීම. සෙල්ලම් මිදුල නිරීක්ෂණය හා උපකරණ භාවිත කරමින් සෙල්ලම් කිරීමට අවස්ථාව ලබා දීම. (අනතුරු පිළිබඳ අවධානය යොමු කිරීම.) වැඩිමහල් සහෝදර සහෝදරියන් සිටින ස්ථාන නිරීක්ෂණය කිරීම.
පන්ති කාමරය පවිත්‍ර කිරීම; අලංකරණය සඳහා විවිධ නිර්මාණ සැකසීම.
ලස්සන කිරීම්, පවිත්‍ර කිරීම් පිළිබඳ කියවෙන කවි, ගායනා, රංගන සහ ඒවා පිළිබඳ කතන්දර ඉදිරිපත් කිරීම.
සෙල්ලම් මිදුල භාවිත කරමින් කෙරෙන නිදහස් චලන ක්‍රියාකාරකම්හි නිරත වීම.

තේමාව :- 2.0 අපේ ගෙදර

**නිපුණතා :-**

නිවසේ සාමාජිකයන් විසින් කෙරෙන කාර්යයන් අගයමින් වඩා ඵලදායී ලෙස අන්තර් ක්‍රියාවන්හි නියැලෙයි.
පවුලේ සාමාජිකයන්ගේ භූමිකා විවිධ මාධ්‍ය තුළින් ඉදිරිපත් කරයි.
විවිධ භූමිකාවලට උචිත පරිදි ආගන්තුක සත්කාරයන්හි යෙදෙයි.
නිවසේ ඇති කරන සුරතල් සතුන් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.
සතුන්ගෙන් විය හැකි අනතුරුවලින් ආරක්ෂා වීමට ක්‍රියා කරයි.
නිවසේ දී කරන ළමා ක්‍රීඩා කිහිපයක නියැලෙයි.

**අන්තර්ගතය :-**

තම ගෙදර සිටින අය පිළිබඳ තොරතුරු
ගෙදරට පැමිණෙන ඥාති හිත මිතුරන් පිළිබඳ තොරතුරු
ගෙදරක ඇති දේවල් හා ඒවායින් ගත හැකි ප්‍රයෝජන
ගෙදරට අවශ්‍ය දේවල් සපයන අය
ගෙදර කෙරෙන විවිධ වැඩ කටයුතු හා ඒ අතරින් තමාට කළ හැකි වැඩ කටයුතු
පවුලේ විවිධ භූමිකා නිරූපණය
සුරතල් සතුන්, එම සතුන්ගෙන් සිදුවිය හැකි අනතුරු හා ආරක්ෂා වන අයුරු
නිවසේ දී සිදු කරන ක්‍රීඩා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

පවුලේ සාමාජිකයන් සහ ගෙදරක කෙරෙන මූලික වැඩ කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම හා අභිරූපණයෙහි යෙදීම.
නිවසක සිදුවන කාර්යයන් පිළිබඳ ව සෙල්ලම් ගෙයක් ඇසුරින් අත්දැකීම් ලැබීම සහ අභිරූපණය කිරීම.
ගෘහාශ්‍රිත ක්‍රීඩා කිහිපයක නිරත වීම
නිවසේ කෙරෙන කාර්යයන් හා නිවසේ සිටින අයගේ භූමිකා පිළිබඳ කවි, ගී හා රංගනවල යෙදීම.
ගෙදරක සිටින සුරතල් සතුන් පිළිබඳ හඳුනා ගැනීම හා සතුන් අනුකරණය කිරීම.
ගෙදරක ඇති ප්‍රධාන ස්ථාන හා තබා ඇති උපකරණ පිළිබඳ සාකච්ඡා කිරීම.
උපකරණ සහ ඒවායේ ප්‍රයෝජනය පිළිබඳ ව කවි, ගී ගායනා හා රංගනයන් හි නිරත වීම.
සරල උපකරණ කිහිපයක් පරිහරණය හා ඉන් ආරක්ෂා වන ආකාරය පිළිබඳ දැනුවත් වීම.
ගෙදර ආරක්ෂාව, අලංකාරය හා පිරිසිදුකම පිළිබඳ ව අදාළ නිර්මාණ හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීම.

## තේමාව :- 3.0 වත්තට එන සත්තු

**නිපුණතා :-**

පාසල් වත්තට එන සතුන් පිළිබඳ ව නිරීක්ෂණ කර වාර්තා කරයි.
සතුන් වර්ගීකරණය කරයි.
චාලක ක්‍රියාකාරකම් ඇසුරින් සතුන්ගේ චර්යා විදහා දක්වයි.
විවිධ ද්‍රව්‍ය ඇසුරින් සත්ත්ව ආකෘති නිර්මාණය කරයි.
සතුන් පිළිබඳ ගීත ගායනය හා රංගන සඳහා දායක වෙයි.
සතුන් පිළිබඳ සංවේදී වෙයි.
සත්ත්ව චරිත පිළිබිඹු කෙරෙන ක්‍රීඩාවල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

වත්තට එන සතුන් (කුරුල්ලන්, කෘමි සතුන්, වැනි ..) පිළිබඳ තොරතුරු
සතුන් ගන්නා ආහාර
සතුන්ගේ විශේෂ වූ හැසිරීම් රටා, ඒවා නිරූපණය කිරීම හා සතුන්ගේ හැසිරීම් ආශ්‍රිත ක්‍රීඩා
සතුන් ද පරිසරයේ ම කොටසක් බව සලකමින් ක්‍රියා කිරීම
සත්ත්ව ආකෘති නිර්මාණ, වෙස් මුහුණු නිර්මාණ
සතුන් සම්බන්ධ කවි, ගී ගායනා, චලන හා රංගන

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

අවට පරිසරයේ සිටින සතුන් විවිධ ලක්ෂණ අනුව කාණ්ඩ කිරීම.
පාසල් වත්තේ දැකිය හැකි සතුන් නිරීක්ෂණය, ඉන් සතුන් කිහිපදෙනකු පිළිබඳ ව සුවිශේෂී ව තොරතුරු ලබා ගැනීම සහ විවිධ අයුරින් වාර්තා කිරීම
සතුන් අනුකරණය, සත්ත්ව ආකෘති නිර්මාණය, වෙස් මුහුණු සකස් කිරීම හා කවි ගී ගායනය තුළින් වින්දනයක් ලැබීම.
සතුන්ට උපකාර වීමේ ගුණය ප්‍රදර්ශනය කළ හැකි කෙටි නාට්‍ය හා රංගනවල යෙදීම.
සත්ත්ව චර්යා ආශ්‍රිත ක්‍රීඩාවල නිරත වීම.

## තේමාව :- 4.0 ජලය සමඟ සෙල්ලම්

**නිපුණතා :-**

ජලය සමඟ ද්‍රව්‍යයන් දක්වන අන්තර් ක්‍රියා විවිධ අයුරින් හැසිරවීම් පිළිබඳ අත්හදා බලයි.
ජලය තැනකින් තැනකට ගෙන යාමේ ක්‍රම අත්හදා බලයි.
ජලය ඇසුරින් විවිධ නිර්මාණ කරයි.
විවිධ කටයුතු සඳහා ජලය අරපිරිමැස්මෙන් යුතු ව ප්‍රයෝජනයට ගනියි.
ජලය සම්බන්ධ කර ගනිමින් වින්දනාත්මක ව ක්‍රීඩාවන්හි නියැළෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**අන්තර්ගතය :-**

විවිධ ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන ආකාරය (පාවෙන, ගිලෙන, ජලයේ නොපෙනී යන.)

ද්‍රව්‍ය ජලයේ හැසිරෙන ආකාරය වෙනස් කළ හැකි ක්‍රම

(උදා :- පාවෙන දේ ගිල්වීම, ගිලෙන සමහර දේ පා වීමට සැලැස්වීම)

ජලය තැනකින් තැනකට ගෙන යාමේ විවිධ ක්‍රම

ජලයෙන් සිදුවිය හැකි අනතුරු

ජලය හා සම්බන්ධ නිර්මාණ

ජලය සම්බන්ධ කර ගනිමින් කළ හැකි ක්‍රීඩා

ජලයෙන් ලැබෙන ප්‍රයෝජන

ජලය අරපිරිමැස්මෙන් යුතුව භාවිතය

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ජලය සමග විවිධ ද්‍රව්‍ය හැසිරෙන ආකාරය නිරීක්ෂණය සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.

ජලය තැනකින් තැනකට ගෙන යැමේ ක්‍රම අත්හදා බැලීම

ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් ජලයෙන් අප ලබන ප්‍රයෝජන හා ජලය අරපිරිමැස්මෙන් පාවිච්චි කළ යුතු ආකාරය පිළිබඳ අත්දැකීම් ලැබීම.

ජලයෙන් සිදුවිය හැකි අනතුරු පිළිබඳ ව සාකච්ඡා ප්‍රදර්ශන මගින් දැනුවත් වීම.

ජලය ඇසුරින් විවිධ නිර්මාණ කිරීම.

ජලය හා සම්බන්ධ කතන්දර ගායන හා රංගනවල යෙදීම.

ජලය භාවිත කරමින් ක්‍රීඩා කිහිපයක නිරත වීම

## තේමාව :- 5.0 අවුරුදු කාලය

**නිපුණතා :-**

අවුරුදු කාලවල දී වටපිටාවේ සිදුවන වෙනස්කම් ආස්වාදයකින් යුතු ව ප්‍රකාශ කරයි.

අවුරුදු චාරිත්‍රවලට වින්දනාත්මක ව සහභාගි වෙයි.

අවුරුදු උළෙල හා සබැඳි ක්‍රීඩාවල නිරත වෙයි.

අවුරුදු කාලවල ගැයෙන ජන ගී, කවි, ගී ගයමින් රංගනයේ යෙදෙයි.

අවුරුදු කාලයේ දී ලද අත්දැකීම් විවිධ මාධ්‍ය ඇසුරින් නිර්මාණාත්මක ව ප්‍රකාශ කරයි.

**අන්තර්ගතය :-**

අවුරුදු කාලයේ දී ගෙදර දොර වටාපිටාවේ සිදුවන වෙනස්වීම්

අවුරුදු උත්සවය හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර

අවුරුදු ක්‍රීඩා

අවුරුදු පිළිබඳ ව කියැවෙන කවි, ගීත, රබන් පද

අවුරුද්දට පිළියෙල කරන කැවිලිවල ආකෘති

අවුරුදු හා සම්බන්ධ අත්දැකීම් නිර්මාණය සහ භූමිකා රංගන

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

අලුත් අවුරුදු කාලවල දී ගෙදර දොර හා වටපිටාවේ සිදුවන වෙනස්වීම් පිළිබඳ ව අත්දැකීම් සාකච්ඡා කිරීම.

සෙල්ලම් ගෙවල් ඇසුරින් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලැබීම.

අවුරුදු කාලයට සුවිශේෂ වූ ක්‍රීඩාවල නිරත වීම.

අවුරුදු කාලයට සුවිශේෂ වූ ජන ගී, කවි, ගී රබන් පද ගායනය කිරීම හා රංගනයෙහි නිරත වීම.

අවුරුදු කාලයේ දී සකස් කෙරෙන කැවිලිවල ආකෘති මැටි භාවිත කරමින් නිර්මාණය කිරීම හා සිත්ගත් අවස්ථා චිත්‍රයට නැගීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තේමාව :- 6.0 අපට පෙනෙන අහස

නිපුණතා :-

අහස පිළිබඳ නිරීක්ෂණ විවිධ අයුරින් වාර්තා කරයි.
ආකාශ වස්තූන් පිළිබඳ තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
විවිධ අවස්ථාවල දී අහසේ සිදුවන වෙනස්කම් වාලක ක්‍රියාකාරකම් මගින් විදහා දක්වයි.
අහස පිළිබඳ කවි, ගී ගායනා කිරීමෙන් වින්දනයක් ලබයි.
අවකාශ භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

අහසේ දක්නට ලැබෙන දේ
අහසේ දැකිය හැකි දේ පිළිබඳ නිර්මාණ
දහවල් හා රාත්‍රී අහස නිරීක්ෂණය හා දහවල් අහසට වඩා රාත්‍රී අහසේ දක්නට ලැබෙන වෙනස්කම්
අහසේ දැකිය හැකි දේ පිළිබඳ කතන්දර හා කවි ගී ගායනා
අවකාශය භාවිත කෙරෙන ක්‍රීඩා හා ක්‍රියාකාරකම්
අහසේ දැකිය හැකි දේ චිත්‍ර මගින් නිර්මාණය

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

අහස නිරීක්ෂණය කිරීම හා විවිධ අයුරින් වාර්තා කිරීම (වාචික, රංගන, අනුකරණ)
දහවල් හා රාත්‍රී අහස නිරීක්ෂණය කිරීම හා හඳුනා ගත් ලක්ෂණ, ගායන, රංගන හා කතන්දර ඇසුරින් ඉදිරිපත් කිරීම
විවිධ ද්‍රව්‍ය ඇසුරින් අහසේ දක්නට ලැබුණ දේ නිර්මාණය කර ඉදිරිපත් කිරීම
අවකාශය භාවිත කරමින් ක්‍රීඩාවල යෙදීම.

තේමාව :- 7.0 අප කන බොන දේ

**නිපුණතා :-**

අප ගන්නා ආහාර උචිත අයුරින් වර්ගීකරණය කරයි.
ශරීරයේ වර්ධනය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
නියමිත වේලාවට හා නියමිත ප්‍රමාණයෙන් ආහාර පාන ගැනීම කෙරෙහි සැලකිලිමත් වෙයි.
පෝෂ්‍යදායී ආහාර වේලක් සකස් කර ගන්නා ආකාරය පිළිබඳ විමසිලිමත් වෙයි.
සිරුරේ මනා වර්ධනය සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
ආහාර හා සෞඛ්‍ය පුරුදු පිළිබඳ ගායනා හා රංගනවල නිරත වෙයි.
යහපැවැත්ම සඳහා වන සෞඛ්‍ය පුරුදු ප්‍රදර්ශනය කරයි.
විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් ආහාර ද්‍රව්‍ය ආශ්‍රිත නිර්මාණවල යෙදෙයි.

**අන්තර්ගතය :-**

අපට ආහාර ලැබෙන්නේ ප්‍රධාන වශයෙන් ගස්වැල්වලින් හා සතුන්ගෙන් බව
වැඩීම සඳහා ප්‍රමාණවත් ලෙස ආහාර ගැනීම අවශ්‍ය බව
ආහාර පිළියෙල කිරීමේ දී සිදු කරන විවිධ දේ හා ඉන් එකක් පිළිබඳ ව අත්හදා බැලීම.
ආහාර පිළියෙල කිරීමේ දී සහ අනුභව කිරීමේ දී පිරිසිදුකමේ වැදගත්කම
ආහාර ගැනීමේ දී දත්වලින් ඉටු වන කාර්යය හා දත් ආරක්ෂා කර ගැනීමේ පුරුදු
ආහාර ගැනීම හා සම්බන්ධ සිරිත් විරිත්, ඒවා පිළිපැදීමේ පුරුදු හා වැදගත්කම
ආහාර ගැනීම මෙන් ම පිරිසිදු ජලය පානය කිරීමේ වැදගත්කම
ආහාර හා සෞඛ්‍ය පුරුදු පිළිබඳ කවි, ගී, කතන්දර, නාට්‍ය
විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් ආහාර ද්‍රව්‍ය ආශ්‍රිත නිර්මාණ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ආහාරපානවල අඩංගු වන්නේ ගස්වැල්වලින් හා සතුන්ගෙන් ලබා ගන්නා දේ බවට අත්දැකීම් ලැබීම සඳහා ක්‍රියාකාරකම්වල නිරත වීම.

සිය සිරුරේ වැඩීම පිළිබඳ අත්දැකීම්, සාකච්ඡා හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් ලබා ගැනීම.

ආහාර පිළියෙල කිරීමේ දී පිළිපැදිය යුතු හොඳ සිරිත් මෙන් ම පිරිසිදුකම රැක ගැනීමේ අවශ්‍යතාව ප්‍රදර්ශනය කිරීම සඳහා ආහාර වේලක් සකස් කිරීම උදා :- බත් වේලක් සඳහා එළවලු හා මැල්ලුමක්/ පලතුරු/සලාදයක්/පලතුරු බීමක්

දත්වලින් කෙරෙන කාර්යයන් හඳුනා ගැනීම, දත් ආරක්ෂා කර ගැනීමේ නිවැරදි පුරුදු පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලැබීම.

සෞඛ්‍ය පුරුදු ඇතුළත් වන කෙටි නාට්‍යයක් රඟ දැක්වීම ගායන හා රංගනවල යෙදීම.

විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් එළවලු, පලතුරුවල ආකෘති නිර්මාණ, වෙස් මුහුණු සකස් කිරීම.

ශරීරයට ව්‍යායාම ලබා දෙන ක්‍රීඩා කිහිපයක නිරත වීම.

## තේමාව :- 8.0 තොරතුරු ලැබෙන හැටි

**නිපුණතා :-**

තමාගේ හා තමාට සමීප අය පිළිබඳ තොරතුරු ආචාරශීලී ව ප්‍රකාශ කරයි.

අන්‍යයන්ගේ තොරතුරුවලට ආචාරශීලී ව සවන් දී ප්‍රතිචාර දක්වයි.

ආචාරශීලී ව සුහද කතා බහේ යෙදෙයි.

විවිධ කාර්යයන්හි දී අන්‍යයන් සමඟ ආචාරශීලී ව අන්තර් ක්‍රියාවල නියැලෙයි.

ඇසූ දුටු දෙයක් අංගචලන සහිත ව ඉදිරිපත් කරයි.

**අන්තර්ගතය :-**

තමා පිළිබඳ තොරතුරු තවත් කෙනෙකුට පැවසීම.

තවත් කෙනෙකුගේ තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්න කිරීම.

පාසලේ තොරතුරු තවත් කෙනෙකුට විස්තර කිරීම.

තොරතුරු ලැබෙන විධි

තොරතුරක් අංග චලනයෙන් යුතු ව ප්‍රකාශ කිරීම.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

තමා පිළිබඳ තොරතුරු ප්‍රකාශ කිරීම හා තවත් කෙනෙකුගේ තොරතුරු අසා දැන ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි යෙදීම.

ඇසූ- දෙයක් දුටු දෙයක් අංග චලන සහිත ව ඉදිරිපත් කිරීම.

තොරතුරු ලැබෙන විවිධ ක්‍රම පිළිබඳ සොයා බැලීම, පාසල තුළ තොරතුරු හුවමාරු වන විවිධ ක්‍රම නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම.

තම නිරීක්ෂණ ඇසුරින් ලබා ගත් තොරතුරු පිළිබඳ නිදහස් අදහස් ප්‍රකාශ කිරීම, චිත්‍ර මගින් ඉදිරිපත් කිරීම.

## තේමාව :- 9.0 වටාපිටාවේ සිදුවන වෙනස්කම්

**නිපුණතා :-**

තම අවට පරිසරය පිරිසිදුව පිළිවෙළකට තබා ගැනීමට දායක වෙයි.

පාසල අවට ස්වභාවික පරිසරයේ වෙනස්කම් නිරීක්ෂණය කරමින් එහි සුන්දරත්වය රැක ගැනීමට දායක වෙයි.

පරිසරයේ විවිධත්වය හා සුන්දරත්වය කවි, ගී, චලන, චිත්‍ර, කෙටි නාට්‍ය ඇසුරින් ප්‍රකාශ කරයි.

අව්ව, වැස්ස හා සුළං ආශ්‍රිත ව පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර උචිත අයුරින් වාර්තා කරයි.

ස්වභාවික පරිසරයේ සිදුවන වෙනස්කම් හා හදිසි තත්ත්වයන් පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.

අව්ව, වැස්ස හා සුළං අවස්ථාවල දී භාවිතයට ගත හැකි සරල නිර්මාණ සකස් කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**අන්තර්ගතය :-**

තම අවට පරිසරයේ පිරිසිදු හා ක්‍රමවත් බව

පාසල අවට ඇති ගස්වැල්වල සිදු වන වෙනස්කම්

සුළඟ සමඟ වටාපිටාවේ සිදුවන වෙනස්කම්

ඉර අව්ව වැටීම නිසා වටාපිටාවේ ඇති වන වෙනස්කම්

වැසි දවස්වල වටාපිටාවේ ඇති වන වෙනස්කම්

සුළඟ, අව්ව, වැස්ස ආදි වටාපිටාවේ ඇති වෙනස්කම් පිළිබඳ කියවෙන කවි, ගී, ගායන, රංගන, කතන්දර වටාපිටාවේ වෙනස් වීම් පිළිබිඹු වන නිර්මාණ

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

තම ආසන්න පරිසරය පිරිසිදු ව පිළිවෙලකට පවත්වා ගැනීමට කළ හැකි දේ සාකච්ඡා කිරීම සහ තමාට කළ හැකි දේ සඳහා දායකත්වය ලබා දීම

පාසල් වත්තේ ගස් වැල් සහිත නිශ්චිත ස්ථානයක් නිරීක්ෂණය කිරීම හා හඳුනා ගත් තොරතුරු චිත්‍ර, ගායන, රංගන හා චලන ඇසුරින් ප්‍රකාශ කිරීම

වැස්ස මගින් සිදුවන පාරිසරික වෙනස්කම් නිරීක්ෂණය හා නිරීක්ෂණ වාචික, ගායන, රංගන, චිත්‍ර මගින් ප්‍රකාශ කිරීම

සුළඟ නිසා පරිසරයේ සිදුවන වෙනස්වීම් නිරීක්ෂණය හා සුළං බලපෑමෙන් ක්‍රියාත්මක කළ හැකි සරල ක්‍රියාකාරකම්හි නිරත වීම. උදා :- සැහැල්ලු දේ පා කර හැරීම පුළුන්, බැලුම් බෝල වැනි දෑ

සුළඟේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු කෙරෙන ගායන සහ රංගන

සුළඟ හා වෙනත් හදිසි ස්වභාවික තත්ත්වයන් මගින් සිදුවන අනතුරු පිළිබඳ අත්දැකීම් සාකච්ඡා කිරීම හා ඒ පිළිබඳ ව දැනුවත් වීම

ස්වභාවික හේතු නිසා පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබිඹුවන කෙටි නාට්‍ය

චාලක හා පේශී වර්ධනයට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම

ඉර අව්ව නිසා පරිසරයේ සිදුවන වෙනස්කම් හා ඉර එළියෙන් ලැබෙන ප්‍රයෝජන සාකච්ඡා කිරීම හා ක්‍රියාකාරකම් කිහිපයක් අත්හදා බැලීම.

## තේමාව :- 10.0 කැමති - අකමැති

**නිපුණතා :-**

ප්‍රියජනක නොවන ස්ථානයක් ප්‍රියජනක ස්ථානයක් බවට පත් කිරීමට දායක වෙයි.

අන් අය අකමැති හැසිරීම්වලින් වැළකී සිටීමට ක්‍රියා කරයි.

අප අකමැති එහෙත් අපට මුහුණ දීමට සිදුවන අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දිය හැකි ආකාර යෝජනා කරයි.

බහුතරයක් කැමති ක්‍රීඩා, ගායනා සහ රංගනවල යෙදෙයි.

තමන් කැමති නිර්මාණයක් තමන් කැමති මාධ්‍යයක් භාවිත කරමින් කිරීමට ඉදිරිපත් වෙයි.

**අන්තර්ගතය :-**

වටාපිටාවේ අපි කැමති හා අකමැති ස්ථාන නිරීක්ෂණය

වටාපිටාවේ අකමැති ස්ථාන කැමති ස්ථාන බවට පත් කිරීමට කළ යුතු දේ

මිනිසුන්ගේ අප අකමැති හැසිරීම් හඳුනා ගැනීම හා ඒවායින් වැළැකී සිටීමට කළ යුතු දෑ

තමා අන් අයට ප්‍රිය කෙනකු වීමට තමා තුළ ඇති කර ගත යුතු මෙන් ම වර්ධනය කර ගත යුතු පුරුදු සහ ඉවත් කළ යුතු පුරුදු

පාසලේ දී සිදු වන අප අකමැති සිදුවීම් (අනතුරු, පාරිසරික හානි වැනි) හා එවැනි සිදුවීම් වැළැක්වීමට හෝ ඒවායින් ඈත් ව සිටීමට හෝ බේරී සිටීමට හෝ කළ යුතු දේ

තමන් කැමති අත්දැකීමක්/ සිදුවීමක් චිත්‍රයට නැගීම

තමන් කැමති රංගනයක්/කතන්දරයක්/ අභිරූපනයක් ඉදිරිපත් කිරීම.

කැමති ක්‍රීඩා කිහිපයක නිරත වීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ආසන්න පරිසරයේ ඇති ප්‍රියජනක නොවන ස්ථානයන් එසේ වීමට හේතු සාකච්ඡා කරමින් ප්‍රියජනක ස්ථාන බවට පත් කර ගැනීමට ක්‍රියාකාරකම්වල නිරත වීම

පන්තියේ සිසුන් වඩාත් ප්‍රියජනක හා වින්දනයක් ලැබිය හැකි ක්‍රීඩා, ගායනා, භූමිකා රංගන, චිත්‍ර සහ වෙනත් නිර්මාණවල යෙදීම

ආසන්න පරිසරයේ සිදුවන අකමැති සිදුවීම් (හදිසි අනතුරු, ස්වභාවික විපත්, රෝග) පිළිබඳ ව තොරතුරු රැස් කිරීම හා ඉන් වැලකීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම

තේමාව :- 11.0 අපට ඕනෑ දේ ලැබෙන හැටි

**නිපුණතා :-**

අපට අවශ්‍ය දේ ලබා දීමට දෙමාපියන්, වැඩිහිටියන් දරණ වෙහෙස අගයයි. ලැබෙන දේ පිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරයි.

අපට එදිනෙදා අවශ්‍ය ආහාරපාන හැකි අයුරින් ගෙවත්තේ ම නිපදවා ගැනීමට දායක වෙයි.

නගරයේ/ගමේ වෙළෙඳ පොළ පිළිබඳ ව අත්දැකීම් ප්‍රකාශ කරයි.

වෙළෙඳ පොළ ආශ්‍රිත සිදුවීම් නිරූපණය කරයි.

විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් එළවළු, පලතුරුවල ආකෘති නිර්මාණය කරයි.

විවිධ ආහාර වර්ග හා වෙළෙඳ පොළ චරිත පිළිබඳ කවි, ගී ගායනා හා රංගනයේ යෙදෙයි.

එළවළු හා පලතුරුවල නම් භාවිත කරමින් වින්දනාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.

**අන්තර්ගතය :-**

අපට ඕනෑ දේ ලබා දීම සඳහා මව්පිය, වැඩිහිටි අය ක්‍රියා කරන අන්දම

පාසලේ දී, ගෙදර දී, අපට ඕනෑ දේවල් ලැබෙන ආකාරය

නගරයේ වෙළෙඳපොළක හෝ ගමේ වෙළෙඳපොළක හෝ සිදු වන දේ

වෙළෙඳ පොළක අත්දැකීම් ලැබීම හා ඒවා වාර්තා කිරීම (වාචික, රංගන, චිත්‍ර)

අපි පරිහරණය කරන දේවල් නාස්ති නො කිරීම වැනි යහපුරුදු

එළවළු හා පලතුරුවල නම් යොදා ගනිමින් කෙරෙන ක්‍රීඩා

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

පළමුවන ශ්‍රේණියේ සිසුන්ට එදිනෙදා කටයුතුවල දී අවශ්‍ය මොනවා දැයි සිසුන් සමඟ කතා බහෙන් හඳුනා ගැනීම හා අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වීම

ගමේ හෝ නගරයේ වෙළෙඳ පොළක් නිරීක්ෂණයට යාම හා නිරීක්ෂණ ඇසුරින් ලබා ගන්නා තොරතුරු විවිධ අයුරින් වාර්තා කිරීම (වාචික, අභිනය, භූමිකා රංගන, කවි, ගී, ගායනා, රංගන, චිත්‍ර හා නිර්මාණ)

එළවළු හා පලතුරුවල නම් භාවිත කරමින් කෙරෙන ක්‍රීඩා

පන්ති මට්ටමෙන් හෝ පාසල් මට්ටමෙන් වෙළෙඳ පොළක් සංවිධානය කිරීම.

තේමාව :- 12.0 ගමන් බිමන්

**නිපුණතා :-**

අවස්ථාවට උචිත නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ගමන් කරයි.

අප පාසලට යන එන ආකාර හා මිනිසුන් ගමන් බිමන් යන එන ආකාර පිළිබඳ ව සොයා බලා වාර්තා කරයි.

ගමන් බිමන්වල දී අන්‍යයන්ගෙන් ලැබෙන උදව් අගය කරමින් හැකි අයුරින් අන්‍යයන්ට උදව් කරයි.

ගමන් බිමන් යන ආකාර ගායන, රංගන, චලන මගින් ඉදිරිපත් කරයි.

ගමන් බිමන් යන විට සිය ආරක්ෂාව පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.

ක්‍රීඩාවල නිරත වෙමින් සමබරතාව රැක ගනියි.

විවිධ මාධ්‍ය භාවිතයෙන් සිය අත්දැකීම් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**අන්තර්ගතය :-**

සිසුන්, ගුරුවරුන් හා වෙනත් අය පාසලට යන එන ආකාර
ඇවිදිමින්, විවිධ දේවල් ගෙන යමින්, විවිධ වාහන භාවිත කරමින් මිනිසුන් ගමන් බිමන් යන ආකාර
මිනිසුන් භාවිත කරන විවිධ වාහනවල ආකෘති නිර්මාණය
ඇවිදීමේ, සිට ගැනීමේ නිවැරදි ඉරියව්
පාරේ ගමන් කළ යුතු ආකාරය හා යන එන විට සිදු වන අනතුරු සහ ආරක්ෂාකාරී පුරුදු
ගමන් බිමන් හා සම්බන්ධ කියැවෙන කතන්දර ගායනා, රංගන සහ අභිරූපන
සමබරතාවයෙන් යුක්ත ක්‍රීඩා

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ගමන් බිමන් යාමේ උචිත ඉරියව් හඳුනා ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.
සිට ගැනීම, ඉඳ ගැනීම, සමබර ඇවිදීම, නිවැරදි ඉරියව්වලට අදාළ හුරුකම් ලැබීමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්.
පාසලට සිසුන් පැමිණෙන ආකාරය පිළිබඳ කතා බහ කිරීම හා යන එන ආකාර දැක්වෙන කවි, ගී ගායනා හා භූමිකා රංගන ඉදිරිපත් කිරීම.
ගමනාගමනය සඳහා භාවිත වන විවිධ වාහන නිරීක්ෂණ, රූප, පින්තූර ඇසුරින් හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම් හා ඒවා විවිධ අයුරින් වාර්තා කිරීම. (වාචික, රූපික, ප්‍රස්තාර, චිත්‍ර, ගායනා හා රංගන)
ගමන් බිමන්වල දී සිය ආරක්ෂාව සලසා ගැනීම හා අනතුරුවලින් වළක්වා ගත යුතු ආකාරය පිළිබඳ ව ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.
විවිධ වාහන ගමන් කරන ආකාරය හා හඬ අනුකරණය කරමින් කෙරෙන ක්‍රීඩා සහ සමබරතාවය රැකෙන ක්‍රීඩාවන්හි යෙදීම.

## තේමාව :- 13.0 එළිය (ආලෝකය) සමඟ සෙල්ලම්

**නිපුණතා :-**

යමක් දැකීමට ආලෝකය හා ඇසේ පෙනීමේ හැකියාව එකසේ වැදගත්වන බව අවබෝධ කර ගනිමින් කටයුතු කරයි.
ඇසේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ක්‍රියා කරයි.
ආලෝක ප්‍රභව පිළිබඳ ව තොරතුරු රැස් කරයි. විවිධ අයුරින් වාර්තා කරයි.
ක්‍රීඩාවල නිරත වෙමින් සෙවනැලි රටා නිර්මාණය කරයි.
එළිය ආශ්‍රිත කවි, ගී ගායනා කරමින් රංගනයේ යෙදෙයි.

**අන්තර්ගතය :-**

යමක් දැකීමට එළියත් ඇසත් යන දෙකෙහිම අවශ්‍යතාව
ඇස ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් බව
සෙවනැලි යොදා ගනිමින් කරන විවිධ නිර්මාණ
හිරු එළිය හැරුණු විට එළිය ලබා ගත හැකි වෙනත් ක්‍රම
කැඩපත (තල දර්පණය) මගින් එළිය හරවා යැවීම හා ඒ ඇසුරින් විවිධ ක්‍රියාකාරකම්
වර්ණ එළි ඇසුරින් කරන විවිධ නිර්මාණ
ආලෝකය හා සම්බන්ධ වස්තූන් හා සතුන් පිළිබඳ ලියැවුණු කවි, ගී ගායනා හා රංගන

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

යමක් දැකීමට එළිය අවශ්‍ය බව දැනුවත් වීම හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත වීම
කැඩපත් භාවිතයෙන් එළිය හැරවීමට හැකි බව අත්විඳිය හැකි ක්‍රියාකාරකම්වල නිරත වීම
ස්වභාවික ආලෝකය සූර්යාගෙන් ලැබෙන බව හා විවිධ එළි පිළිබඳ සිසුන් ලබන අත්දැකීම් ඇසුරින් සාකච්ඡා කිරීම
එළිය හා සබඳතා දක්වන කවි, ගී තාල තබමින් ගායනය හා රංගනවල නිරත වීම
අවකාශ භාවිතයට ගනිමින් සෙවනැලි ආශ්‍රිත ක්‍රීඩාවල යෙදීම
සෙවනැලි හා වර්ණ එළි යොදා ගනිමින් විවිධ නිර්මාණ කිරීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තේමාව :- 14.0 මිනිසුන් වැඩ කරන තැන්

**නිපුණතා :-**

සමීප පරිසරයේ මිනිසුන් වැඩ කරන ස්ථාන හා ඔවුන් ආරක්ෂාව සලසා ගන්නා ආකාරය පිළිබඳ ව තොරතුරු සොයා බලා වාර්තා කරයි.
එකිනෙකට වෙනස් කාර්යන් සඳහා භාවිත කරන උපකරණ, මෙවලම්, ඇඳුම් පැළඳුම් සහ එම කාර්යයන්ට අදාළ කාර්ය භාරය හා විවේකය ගත කරන ආකාර පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
විවිධ වැඩවල නිරත වන මිනිසුන්ගේ සේවාවන් අගය කරමින් ඔවුන් කෙරෙහි ගරුත්වයකින් යුතු ව කටයුතු කරයි.
වැඩ කරන ස්ථාන හා සම්බන්ධ චරිත සිද්ධි හා අවස්ථා, ගායනා හා රංගන මගින් ඉදිරිපත් කරයි.
මිනිසුන් වැඩ කරන තැන් පිළිබඳ තමන් සිත්ගත් අවස්ථා චිත්‍රයට නගයි.
මිනිසුන් වැඩ කරන ස්ථාන හා සම්බන්ධ උපකරණවල ආකෘති නිර්මාණය කරයි.

**අන්තර්ගතය :-**

සමීප පරිසරයේ පිහිටි කම්හලක් / ගොවිපලක් / වඩුමඩුවක් / සත්ත්ව ගොවිපලක් / ධීවර කර්මාන්තයේ යෙදෙන ස්ථානයක් . . . වැනි ස්ථානයක මිනිසුන් කරන විවිධ වැඩ
විවිධ වැඩ සඳහා භාවිත කරන ආවුද / උපකරණ
වැඩ කරන ස්ථානයක් පිළිබඳ තොරතුරු (නිපදවන දේ, සේවකයින්ගේ ඇඳුම් පැළඳුම්, ආහාර හා ආරක්ෂාව)
වෙහෙස නිවා ගැනීමට වැඩ කරන අවස්ථාවල දී ගැයෙන කවි, ගී
වැඩ කරන ආකාරය විදහා දැක්වෙන ගායන, රංගන හා චලන

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

සමීප පරිසරයේ වැඩ කරන ස්ථානයක් නිරීක්ෂණය කිරීම; එම ස්ථානයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු රැස් කිරීම හා විවිධ අයුරින් වාර්තා කිරීම
වැඩ කරන මිනිසුන්ගේ ආහාර, වැඩට ඇති සුදානම, ආරක්ෂාව මෙන් ම වගකීම් පිළිබඳ නිරීක්ෂණ තුළින් අත්දැකීම් ලැබීම
නිරීක්ෂණය කරන ලද ස්ථානයෙන් ලබා ගත් තොරතුරු ආශ්‍රිත භූමිකා රංගන කවි ගී ගායනා හා චිත්‍ර මගින් නිරූපණය කිරීම
එකමුතු ව වැඩ කිරීමේ දී වැදගත්කම, ඒ හා සම්බන්ධ කතන්දර, ජනප්‍රවාද හා කවි ගී ගායනා ඉදිරිපත් කිරීම

තේමාව :- 15.0 වටාපිටාවේ වෙනස් තැන්

**නිපුණතා :-**

අවට පරිසරයේ විවිධත්වය හඳුනා ගැනීම සඳහා සරල අත්හදා බැලීම් කරයි.
ආසන්න පරිසරයේ ස්ථාන කිහිපයක පැළ වැඩෙන ආකාරය හා ඒවායේ ජීවත් වන සතුන් පිළිබඳ තොරතුරු වාර්තා කරයි.
පරිසරයෙන් රැස් කෙරෙන විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් නිර්මාණ කරයි.
පරිසරයේ විවිධ ද්‍රව්‍ය ආශ්‍රයෙන් වර්ණ සකස් කර නිර්මාණ අලංකරණය කරයි.
පරිසරයේ විවිධත්වය පිළිබඳ ව කොලාජ්, මැටි මාධ්‍යයන්ගෙන් නිර්මාණ කරයි.
පරිසරයේ විවිධත්වය පිළිබඳ වින්දනයක් ලබමින් ගායනා, රංගන හා චලනවල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

පාසල් වත්තේ තෝරා ගත් කොටසක ඇති විවිධ හැඩ ඇති කොළ සහිත ගස්, විවිධ පාට හා හැඩ ඇති මල් සහිත ගස්, පාට පාට ගල්, වැලි හා පස්, කුඩා සත්ත්ව වර්ග වැනි දෑ පිළිබඳ ගවේෂණය
පාසල් වත්තේ හෝ ආසන්නයේ තෝරා ගත් ස්ථාන දෙකක් අතර පවත්නා වෙනස්කම්
ජලය ඇති තැන්වල හොඳින් වැඩෙන විශේෂ ගස් වර්ග හා එවැනි තැන්වල ජීවත් වන සත්ත්ව වර්ග
පරිසරයේ විවිධත්වය මතු වන ජනකවි ගායනය, ඇසීම හා රංගන
වටාපිටාවේ වෙනස් තැන්වලින් ලබා ගත් ද්‍රව්‍ය ඇසුරෙන් විවිධ නිර්මාණ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

වටපිටාවේ ඇති විවිධත්වය අවබෝධය සඳහා තෝරා ගත් නිශ්චිත ස්ථාන නිරීක්ෂණය කිරීම
විවිධ ස්ථානවල වැඩෙන පැළැටි නිරීක්ෂණය කිරීම හා තොරතුරු විවිධ අයුරින් වාර්තා කිරීම
පරිසර විවිධත්වය මතු කෙරෙන චලන ගවේෂණ ක්‍රීඩාවල නියැලීම
කොලාජ්/මැටි මාධ්‍ය භාවිතයෙන් පරිසර විවිධත්වය නිර්මාණය කිරීම
පරිසරයෙන් සොයා ගන්නා ද්‍රව්‍ය ඇසුරින් නිර්මාණ කිරීම

තේමාව :- 16.0 අපේ උදවු ඕනෑ අය

**නිපුණතා :-**

පාසලේ දී හා නිවසේ දී අවශ්‍ය උදවු ලබා ගැනීමටත් අන් අයට අවශ්‍ය උදව් කිරීමටත් ඉදිරිපත් වෙයි.
උදවු අවශ්‍ය අයට උපකාර කරන අවස්ථා හා සිද්ධි පිළිබඳ සංවේදිතාවයෙන් යුක්තව ගායන හා රංගන ඉදිරිපත් කරයි.
විශේෂිත පුද්ගලයන් කෙරෙහි සංවේදී ව ක්‍රියා කරයි.
අන් අයට සහයෝගය දෙමින් සාමූහික ක්‍රීඩාවල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

එදිනෙදා කටයුතුවල දී තවත් අයගේ උදවු ලබා ගන්නා හා අන් අයට උදවු කරන අවස්ථා
උදවු අවශ්‍ය වන අයට උදවු කරන අවස්ථා නිරූපණය
උදවු ලබා ගැනීමේ දී ආචාරශීලී වීම හා උදවු කළ අයට ස්තුති කිරීම
විශේෂ උදවු ඕනෑ අය හඳුනා ගැනීම හා ඔවුන් භාවිත කරන විවිධ භාණ්ඩ හෝ සංඥා (කිහිලිකරු, හැරමිටිය, සුදු සැරයටිය)
උදවු අවශ්‍ය අයට උදවු කිරීම.
උදවු සඳහා උපකරණ නිර්මාණ
සතුන් ට හා ගස්වැල්වලට අපේ උදවු අවශ්‍ය බව
එදිනෙදා කටයුතුවල දී එකිනෙකාට උදවු අවශ්‍ය බව දැක්වෙන සිද්ධි/ කතන්දර/ අවස්ථා
අන් අය සමඟ සහයෝගයෙන් කෙරෙන ක්‍රීඩා

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

එදිනෙදා කාර්යයන් සඳහා එකිනෙකාගේ උදවු ලබා ගන්නා ආකාරය පිළිබඳ අත්දැකීම් කතා බහ කිරීම.
පාසලේ දී මෙන් ම නිවසේ දී උදවු අවශ්‍ය කිහිප දෙනකු කතා බහ තුළින් හඳුනා ගැනීම.
අන්‍යෝන්‍ය වශයෙන් උදවු ලබන අවස්ථා මතුවන කතන්දර, (ජන කතා හෝ නිර්මාණ කතා) රංගන
එදිනෙදා කෙරෙන වැඩ අභිරූපන මඟින් නිරූපණය කිරීම, උදවු අවශ්‍ය අයට භාවිත කළ හැකි උපකරණ නිර්මාණය කිරීම.
සතුන්ට ද ගස්වැල්වලට ද අපේ උදවු අවශ්‍ය බව ප්‍රකාශ වන පරිදි ගායන, රංගන, ගීත නාටක ඉදිරිපත් කිරීම
අන්‍යෝන්‍ය සහයෝගයෙන් කෙරෙන ක්‍රීඩාවල නිරත වීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.